**මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ වායු විමෝචන පරීක්ෂණ භාරකාර අරමුදල - 2021**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ වායු විමෝචන පරීක්ෂණ භාරකාර අරමුදලේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විට දී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීම ද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උපවගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

-----------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්**,**

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේ දී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව, සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව යටතේ සිටින නිලධාරීන් 04 දෙනෙකු වායු විමෝචන පරීක්ෂණ භාරකාර අරමුදල වෙත අනුයුක්ත කර එම දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂයේ වැටුප් ලෙස රු.1,699,350ක් ගෙවා තිබුණි. එම නිලධාරීන් සඳහා ගෙවන ලද වැටුප්, අරමුදලේ වියදම් ලෙස හඳුනාගෙන ගිණුම් ගත කිරීමට කටයුතු කර නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා වන අරමුදලේ අතිරික්තය රු.1,699,350කින් අධි තක්සේරු වී තිබුණි. | මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව යටතේ සේවය කරනු ලබන නිලධාරීන් වාහන වායු විමෝචන භාරකාර අරමුදලට අනුයුක්ත කරනු ලබන අතර එම නිලධාරීන් සඳහා දෙපාර්තමේන්තුව මගින්ම වැටුප් ගෙවනු ලබයි. 2022 වර්ෂයේ සිට දෙපාර්තමේන්තුව මගින් අනුයුක්ත කළ නිලධාරීන්ගේ වැටුප් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේශණය කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි. | වර්ෂයට අදාල සියළු වියදම් නිසි පරිදි හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශන වලට ඇතුළත් කිරීම. |
| (ආ) අරමුදල පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය ජලය, විදුලිය සහ වරිපනම් ආදී පොදුකාර්ය වියදම් වෙනුවෙන් සමාලෝචිත වර්ෂයට අදාළ වියදම් හඳුනාගෙන එම වියදම් ගිණුම්වල ගැලපීමට පියවර ගෙන නොතිබුණි. | අදාල වියදම් ගිණුම්ගත වී නොමැති අතර විගණනය විසින් පෙන්වා දී ඇති පරිදි යම් ක්‍රම වේදයකට අනුව මෙම වියදම් ගිණුම් ගත කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි. | වර්ෂයට අදාල සියළු වියදම් නිසි පරිදි හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කිරීම. |

## 1.5.2 අරමුදලේ අඛණ්ඩ පැවැත්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| අමාත්‍ය මණ්ඩල අනුමැතියක් මත වායු විමෝචන පරීක්ෂණ භාරකාර අරමුදල වසා දැමීමට තීරණය කළ බව භාණ්ඩාගාර ලේකම්ගේ 2018 අගෝස්තු 18 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය පරිදි තහවුරු විය. කෙසේ නමුත්, චක්‍රලේඛය පරිදි ඇවරකරුවෙකු පත්කර වත්කම්වලින් වගකීම් නිරවුල්කර ඉතිරිය ඒකාබද්ධ අරමුදලට බැර කිරීමට විගණිත දින වන විටත් කටයුතු කර නොතිබුණි. සමාලෝචිත වර්ෂය අවසානයේදී අරමුදලේ ඉතිරි කිරීම් ගිණුමේ ශේෂය පමණක් රු. මිලියන 259 ක් විය. භාර ඔප්පුවක් යටතේ ස්ථාපනය කර තිබුණු මෙම අරමුදලෙහි දෙපාර්ශවයෙන් භාණ්ඩාගාර ලේකම්වරයා එක් පාර්ශවයක් වූ බැවින්, භාර ඔප්පුවේ 11 (අ) ඡේදය පරිදි, භාණ්ඩාගාර ලේකම්වරයාගේ ප්‍රකාශය මත මෙම අරමුදල අහෝසි වේ. ඒ අනුව, ඉහත චක්‍රලේඛය භාණ්ඩාගාර ලේකම් විසින් නිකුත් කිරීම මත මේ වන විටත් අදාළ ගිවිසුම්ගත බැඳීමෙන් එක් පාර්ශවයක් ඉවත් ව ඇත. මේ නිසා අරමුදල පැවතීමේ නීත්‍යානුකූලභාවය ගැටළුසහගත විය. එසේ හෙයින්, භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්වරයාගේ ප්‍රධානත්වයෙන් භාරකාර මණ්ඩලය රැස් වී අදාළ අරමුදල වෙනුවෙන් අමාත්‍ය මණ්ඩල තීරණයක් ලබාගන්නා තෙක් අරමුදල පවත්වා ගෙන යාමට තීරණය කර තිබුණි. | අරමුදල තවදුරටත් පවත්වාගෙන යාම සඳහා අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කර තිබුණි. ඒ අනුව භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ ප්‍රධානත්වයෙන් භාරකාර මණ්ඩලය රැස්වී අදාළ අමාත්‍ය මණ්ඩල තීරණය ලැබෙන තෙක් අරමුදල පවත්වාගැනීමට තීරණය කර තිබුණි. ප්‍රවාහන අමාත්‍යතුමා වෙත කැබිනට් සංදේශයක් ඉදිරිපත් කිරීම සඳහා ඉල්ලුම් කර ඇත. | අදාළ නෛතික පරිසරය තුළ අවශ්‍ය කටයුතු ඉටු කිරීම. |

## 1.5.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) වායු විමෝචන පරීක්ෂණ භාරකාර අරමුදලේ පාලක මණ්ඩලය විසින් අරමුදල ආරම්භයේ සිටම දීමනා ලබාගෙන තිබුණද, එම දීමනා ලබා ගැනීම සඳහා වූ නෛතික අනුමැතිය විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. සමාලෝචිත වර්ෂයේදී එසේ ගෙවා තිබූ මුදල රු.142,000 ක් විය. | අරමුදලේ ආරම්භයේ සිටම පාලක මණ්ඩලය සඳහා දීමනා ගෙවා ඇති අතර එය පීඊඩී/03/2015 හා ජුනි 17දිනැති චක්‍රලේඛය අනුව සිදුකර ඇත. විගණනයෙන් පෙන්වා දී ඇති පරිදි අරමුදලේ පාලක මණ්ඩලයට අදාලව දීමනා ගෙවීමට අදාල අනුමැතිය ලබා ගැනීමට කටයුතු කර ඇත. | නෛතික අනුමැතීන් සහිත ගෙවීම් පමණක් සිදු කිරීම. |

| | | | |
|---|---|---|---|
| **(ආ)** | වායු විමෝචන පරීක්ෂණ සිදුකරන සමාගම් විසින් අයකරන ගාස්තු පරීක්ෂා කිරීම සඳහා පවතින තොරතුරු පද්ධතිය (ICTA) අක්‍රීය වීම හේතුවෙන් එම සමාගම් වලින් ලැබෙන තොරතුරුවල නිරවද්‍යතාවය පරීක්ෂා කර රජයට ලැබිය යුතු ආදායම නිවැරදිව ලැබුණේද යන්න පරීක්ෂා කිරීම සඳහා වූ ක්‍රමවේදයක් හඳුන්වා දී නොතිබුණි. එම හේතුවෙන් වායු විමෝචන පරීක්ෂණ සිදුකරන සමාගම් විසින් අරමුදල වෙත ප්‍රේශණය කරන ලද රු.272,112,255 ක මුදල විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය. | 2021 වසරේදී දත්ත පද්ධතිය නැවත ස්ථාපිත කිරීමට අවශ්‍ය කටයුතු කරන ලෙස අප විසින් ICTA ආයතනයෙන් ඉල්ලීමක් සිදු කරන ලද අතර අළුතින් ක්‍රියාත්මක කිරීමට නියමිත ERL 2 වැඩසටහන සඳහා මෙම අඩුපාඩු මගහරවා ගැනීම සඳහා නව යෝජනා ICTA වෙත ඉදිරිපත් කර ඇත .තවද වාර්ෂිකව නිකුත් කරන ලද ආදායම් බලපත්‍ර ප්‍රමාණය වැනි තොරතුරු ද ICTA ආයතනය මගින් ලබාගැනීමට කටයුතු කර ඇත. | ආදායම නිසි පරිදි සත්‍යාපනය කළ යුතු වීම. |
| **(ඇ)** | සමාලෝචිත වර්ෂය අවසාන වන විට අරමුදල සතුව සංරචක 05කින් යුත් ස්ථාවර වත්කම් වල වටිනාකම රු. මිලියන 55.95ක් වූ අතර ඒ ඒ වත්කම් නිශ්චිතව සත්‍යාපනය කළ හැකි වන පරිදි වත්කම් ලේඛනය යාවත්කාලීන කර නොතිබුණි. | ස්ථාවර වත්කම් ලේඛණය යාවත්කාලීන කරමින් පවතී. ස්ථාවර වත්කම් කේතගත කිරීමද ලේඛණය යාවත්කාලීන කිරීමට සමගාමීව සිදුකිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි. | නිසි පරිදි යාවත්කාලීන කරන ලද ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන යාම. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

-----------------------------------------

### 1.6.1 අත්තිකාරම්

------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වායු දූෂණ ඇගයීමේ පර්යේෂණ වාර්තා වෙනුවෙන් ශ්‍රී ලංකා ප්‍රතීතන සභාව, පේරාදෙණිය හා මොරටුව විශ්ව විද්‍යාලවලට රු.2,550,847ක් ගෙවා තිබුණද, අදාළ කාර්යයන් එම ආයතන විසින් මේ දක්වාම ඉටුකර දී නොතිබීම නිසා එම ගෙවීම් ඉදිරියට කළ ගෙවීමක් ලෙස ගිණුම් ගත කර තිබුණු අතර දැනට ප්‍රමාද කාලය වර්ෂ 04ක් ඉක්මවා ගොස් ඇති නමුත් මෙම ගෙවීම් නිරවුල් කරගැනීමට අරමුදලේ පාලක මණ්ඩලය විසින් පියවර ගෙන නොතිබුණි. | වායු විමෝචන භාරකාර අරමුදල මගින් පර්යේෂණ සිදු කිරීම සඳහා මුදල් අය කරන ලද, පේරාදෙණිය විශ්ව විද්‍යාලය සහ මොරටුව විශ්ව විද්‍යාලය විසින් සිදු කරන ලද පර්යේෂණයන්ට අදාළ සියලුම වාර්තා අප වෙත ලබා දී ඇත.<br>ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය වෙත අරමුදල විසින් ලබා දී ඇති මුදල් ඔවුන් විසින් යොදා ගෙන ඇත්තේ වාහන වායු විමෝචන පරීක්ෂණ මධ්‍යස්ථාන පරීක්ෂා කිරීමට අදාළ නිලධාරීන් ධාරිතා සංවර්ධන වැඩසටහනක් සඳහා වන අතර, එහි වියදම් වාර්තා ලබා ගැනීමට කටයුතු කරමින් පවතී. | කඩිනමින් අදාළ වාර්තා ලබාගෙන ගෙවීම් නිරවුල් කිරීමට කටයුතු කිරීම. |

**1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| | නීති,රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ දැක්වීම | අදහස් නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | **අංක 01/2020 හා 2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛය සහ මු. රෙ 876 (2) (අ)** | දැනට පවතින අරමුදල් ක්‍රියාත්මක වීම ජාතික අවශ්‍යතාවයක් බව පෙනීයන්නේ නම් හා එම අරමුදල් සඳහා නිසි පරිදි පනතක් මගින් පාර්ලිමේන්තුවේ අනුමත වී නොමැති නම් එම අරමුදල් සඳහා මෙම චක්‍රලේඛය නිකුත් කර වසරක් ඇතුළත පාර්ලිමේන්තුවේ අවසරය ලබාගත යුතු වුවද මේ වන තෙක් අරමුදල විසින් එසේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ ප්‍රධානත්වයෙන් භාරකාර මණ්ඩලය රැස්වී අරමුදලේ පැවත්ම පිළිබඳ සාකච්ඡා කොට අමාත්‍ය මණ්ඩල තීරණය ලැබෙන තෙක් අරමුදල පවත්වා ගැනීමට තීරණය කරන ලදි . ප්‍රවාහන අමාත්‍යතුමා වෙත කැබිනට් සංදේශයක් ඉදිරිපත් කිරීම සඳහා ඉල්ලුම් කර ඇත. | චක්‍රලේඛය පරිදි කටයුතු කිරීම. |
| (ආ) | **මුදල් රෙගුලාසි 877 (2) ඇ** | ගිණුම් වර්ෂය අවසන් වී මාස 02 ක් ඇතුළත කාර්යසාධන වාර්තා පිළියෙල කර රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාට පිටපත් සහිතව විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, එවැනි කාර්සාධන වාර්තාවක් පිළියෙල කර නොතිබුණි. | කාර්යසාධන වාර්තාවක් පිළියෙල කිරීමක් සිදුකර නොමැත .එය සකස් කිරීම මේ වන විට සිදුවන බැවින් ඉදිරියේදි එය අදාල ආයතන වෙත යොමු කිරීමට කටයුතු කිරන බව දන්වා සිටිමි . | -එම- |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.248,572,349ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.250,382,868ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.1,810,519ක පිරිහීමක් නිරීක්ෂණය විය. වර්ෂයේ ආදායම රු.15,550,291කින් අඩු වීම මෙම පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2017 දෙසැම්බර් 10 දිනැති හා අංක MT/02/01/01/02/11/II දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු ලිපිය ප්‍රකාරව මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව යටතේ අංශයක් ලෙස පිහිටුවීමට යෝජිත වායු විමෝචන ව්‍යාපෘති කාර්යාලය සඳහා තනතුරු අනුමත කර තිබුණද, මේ වන තෙක් ඒ අනුව කටයුතු කිරීම සඳහා ප්‍රමාණවත් ක්‍රියාමාර්ගයන් ගෙන නොතිබුණි. | කාර්ය මණ්ඩලය සඳහා තනතුරු නාම සකස් කර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කලද 2017.12.10දිනැති හා අංක MT/02/01/01/02/11/ii දරණ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ ලිපියේ සඳහන්) ඇමුණුම (07-පරිදි ව්‍යාපෘති කාර්යාලය සඳහා තනතුරු රජයේ අනුමත සේවාවලින් ලබා ගැනීම යොජනා වී ඇති බැවින් මේ වන විට භාරකාර අරමුදලේ සේවයේ නියුතු නිලධාරින් එම සේවාවලට අන්තර්ග්‍රහණය කිරීම සම්බන්ධයෙන් ගැටළුවක් මතු වී ඇත. | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු ලිපියේ නිර්දේශ ප්‍රකාරව කටයුතු කිරීම |
| (ආ) වායු විමෝචන භාරකාර අරමුදල මඟින් සුළු මුදල් අත්තිකාරම් සහ ඉන්ධන අත්තිකාරම් ලබා දීමට කටයුතු කර තිබුණද එම අත්තිකාරම්, අත්තිකාරම් ලේඛනයක සටහන් කර වාර්තාගත කිරීමට කටයුතු කර නොතිබූ අතර අත්තිකාරම් නිකුත් කිරීමේදී ප්‍රමාණවත් අභ්‍යන්තර පාලනයක් සිදුනොවන බව නිරීක්ෂණය කෙරේ. | සුළු මුදල් හා ඉන්ධන සඳහා වෙන වෙනම අත්තිකාරම් ලබා ගත්තද ඒ සඳහා වෙන් වෙන් වශයෙන් වියදම් සාරාංශයක් පවත්වාගෙන යාමට කටයුතු කර නොමැත .එබැවින් විගණනයෙන් පෙන්වා දී ඇති පරිදි 2022 වර්ෂයේ සිට සුළු මුදල් හා ඉන්ධන අත්තිකාරම් සඳහා වෙන වෙනම අත්තිකාරම් ලේඛන පවත්වා ගෙන යනු ලබයි. | මනා අභ්‍යන්තර පාලනයක් සඳහා අවශ්‍ය පිළිවෙත් නිශ්චය කිරීම. |

## 4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) මූලික වියදම් සංරචක 04ක අධි ඇස්තමේන්තු සකස් කිරීම නිසා සියයට 37 ක සිට සියයට 83ක අතර පරාසයක ඉතිරිවීම් හේතුවෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබුණු බව නිරීක්ෂණය කෙරේ. | රට තුල පැවති COVID-19 වසංගත තත්වය හමුවේ සැලසුම් කල පරිදි වැඩසටහන් ක්‍රියාත්මක කීරීමට නොහැකි වූ බැවින් ඉදිරි වර්ෂයන් හි අයවැය ඵලදායි ලෙස කළමණාකරණය කීරීමට කටයුතු කරන බව දන්වා සිටිමි. | නිවැරදිව ඇස්තමේන්තු සකස් කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ආ) | මූලධන වැඩසටහන යටතේ ව්‍යාපෘති නවයක් (09) වෙනුවෙන් රු. මිලියන 46ක ක්‍රියාකාරකම් හඳුනා ගෙන තිබුණද, ඉන් ව්‍යාපෘති දෙකක් පමණක් ක්‍රියාත්මක කර ඒ සඳහා රු.697,288ක මුදලක් වැයකර තිබුණි. ඉටු කිරීමට යෝජිත ව්‍යාපෘති වල වටිනාකම මුළු අයවැය ගත වියදමට සාපේක්ෂව සියයට 71ක ප්‍රමාණාත්මක අගයක් ගෙන තිබුණි. දෛනික අවශ්‍යතා වෙනුවෙන් වන පුනරාවර්තන වියදම් පමණක් වැය කරමින් අරමුණු ඉටුකර ගැනීම සඳහා කිසිඳු සංවර්ධන කාර්යයක් ඉටු නොකරමින් අරමුදල පවත්වා ගැනීම ආර්ථික වශයෙන් ඵලදායක ද යන්න ගැටළු සහගත විය. | පැවති කොවිඩ් වසංගත තත්වය යටතේ සැලසුම් කල පරිදි වැඩසටහන් ක්‍රියාත්මක කිරිමට නොහැකි වීම නිසා ප්‍රතිපාදන ඉතිරි වි ඇත. මගහැරුණු වැඩසටහන් ඉදිරියට රැගෙන විත් ඇත .ඒ අනුව දැනුවත් කිරීමේ වැඩසටහන් , ස්ථානීය පරික්ෂා කිරීම් ,පාර්ශවකාර ආයතන ගෙන එනු ලබන ව්‍යාපෘති සදහා ප්‍රතිපාදන වෙන්කිරීම් සිදු කිරීමට කටයුතු සැලසුම් කරමින් පවතී. | හඳුනාගත ඉලක්ක සපුරා ගැනීමට කටයුතු කළ යුතු වීම. |